


# සිහිනි

මිනුදී ලීතුම්යා කොස්සින්න

# සිඟිති

මිනුදී ලීනැමියා කොස්සින්න

**“සිඟිති”**

කර්තෘ ප්‍රකාශනයකි

පළවන මුද්‍රණය: 2023 නොවැම්බර්

**ISBN:** 978-624-206-864-0

කර්තෘගේ වෙනත් කෘති: ***බන්ටී***

මගේ ලොකු අයියා හැමදාමත් ආදරයෙන්

මතක් කරන සත්‍ය කතාවකි.

***කතාව සහ චිත්‍ර*** :

මිනුදි ලිතුමියා කොස්සින්න
2 ශ්‍රේණිය E
මහාමායා බාලිකා විදුහල

# පිදුම

මා නිතරම දිරිමත් කරන
මාගේ පන්තිභාර ගුරුතුමියට
සහ
ආදරණීය දෙමාපියන්ට
මෙම පොත
ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය" හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,  
විදුහල්පතිනිය,  
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.  
2023-10-20

එක්තරා ලස්සන ගමක

පුංචි ලස්සන ගෙදරක්

තිබුණා. ඉතින් මේ ලස්සන

ගෙදර හිටියේ අම්මයි,

තාත්තයි චූටි පුතයි. චූටි

පුතාට ආදරේට කිව්වේ

“පැංචා…”



“අම්මා… අපි සෙල්ලම් කරමුද?” පැංචා පාසල් ඇරිලා ගෙදර ආපු වෙලාවේ ඉඳල කරදරේ අම්මත් එක්ක සෙල්ලම් කරන්න.

“අනේ පුතේ අම්මිට වැඩ තියෙනවනේ.”

“අනේ අම්මි

එන්නකෝ.....”

අහල පහල යාළුවොත්


නැති නිසා පැංචා නිතරම

සෙල්ලම් කලේ අම්මත්

එක්ක.

“හා එහෙනම් අපි යමු

කුඹුර පැත්තට...”



ලස්සන කුඹුරක් අයිනේ

පැංචාගේ ගෙදර තිබුණේ.



“අම්මා අර බලන්න

ලස්සන කුරුල්ලෙක්”

“එයා තමයි පැංචෝ ‘

පිළිහුඩුවා’, ඔය දොළ

පාරේ වක්කඩවල් වල

ඉන්න තිත්ත පැටව් කන්න

ඇවිත් ඉන්නේ”



“එයාට ලස්සන පිහාටු
තියෙනවා නේද අම්මේ?”

ඉතින් හවස් වෙනකම්ම
පැංචයි අම්මයි කුඹුරට
වෙලා හිටියා.

පැංචා නම් නියර දිගේ
වැටි වැටී දුවනවා.....

අම්මා ඒ අතරේ පලා

වර්ගත් හොයාගත්තා.

"පුතේ දැන් හවස්

වෙනවා...එන්න අපි ගෙදර

යමු"

පැංචට නම් තවත් ඉන්න

තමයි හිත.

පසුදා උදෑසනම පැංචා

පාසල් යන්න ලෑස්ති වුණා.

ඉතින්.... අද විශේෂ

දවසක්. පැංචට නම් මතක

නෑ.

අද උදේ අම්මා කිරිබත්

හදලා.


“හරිම රසයි අම්මා”

හවස ගෙදර පුංචි සාදයක්.


**පැංචා** හරිම සතුටින්.

අත්තම්මත් ඇවිත්.

*“Happy Birthday to you!!”*



**හැ**මෝගෙන්ම පැංචට
තෑගි ලැබුණා.
ඒ අතරේ ලස්සන පුංචි අලි
පැටියෙක් හිටියා.



පැංචා ගොඩක්ම කැමති එයාට.

“අලි පැටියෝ, මම ඔයාට ආය කතා කරන්නේ සිඟිති කියලා”

“පිළිහුඩු යාළුවේ, මෙන්න මාගේ අළුත් යාළුවා සිඟිති”

පැංචා එයාගේ අලුත්

යාළුවාව කූඹින්ට,

ගෙවත්තට, කුඹුරට එන

හැම සතෙකුටම පෙන්නුවා.





පැංචා කම්මැලි නෑ, හැමදාමත් ඉස්කෝලේ යනවා, කුඹුරේ කොහේ හෝ තැනක ඉන්න පිළිහුඩු පවුල දකිනවා.

“අම්මේ අර බලන්නකෝ පිළිහුඩු අම්මයි තාත්තයි පුතයි තුන්දෙනාම ඉන්නවා.”

"ඔයා වගේම කම්මැලි

නැතිව එයාලත් උදේම

කෑම හොයාගෙන ඇවිත්"

පැංචා හරිම සතුටින්

හිටියා.

එයා ගොඩක් දක්ෂ

දරුවෙක්.



දැන්

පැංචා ලොකු පුතෙක්..

නිමි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුලින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුලින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,
සෙනෙවිරත්න මහලේකම්,
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20